



# කෝවිඩ් කාලය තුළ අධ්‍යාපනයේ සාධාරණත්වය ගැන කතා කරමු

LAW & SOCIETY TRUST

## ප්‍රජාතන්ත්‍රවාදී සංවාදය, ක්‍රියාකාරී සවන්දීම සහ පුරවැසි සහභාගිත්ව අන්තර්ගතය: වසංගත සහ සමාජ අර්බුද අවස්ථාවන්හීදී පුරවැසි සහභාගිත්වය අන්තර්ගත කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව මුහුණපානු ලබන වසංගත සහ සමාජ- ආර්ථික අර්බුද අතරතුර පුරවැසි සහභාගිත්වය ඇති කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීතියේ ආධිපත්‍යය සහ මහජන වගවීම ශක්තිමත් කිරීමයි. වගකිවයුතු පුරවැසියන් ලෙස අපි ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ මූලධර්ම හා බැඳුණු අර්බුදයන්ට රජය විසින් ප්‍රතිචාර දැක්වීම තහවුරු කර ගැනීමට සහ රජය විසින් විශේෂයෙන් වැරදි තොරතුරු සහ වෛරී අදහස් හුවමාරු වීම වැළැක්වීම තහවුරු කිරීමට මෙන්ම වෙනස්කම් සිදු කරන්නන්ගේ සහ බලපෑම් ඇති කරන්නන්ගේ ධනාත්මක මැදිහත්වීම තුළ සමාජ සහයෝගීතාව ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, ව්‍යාපෘතිය මඟින් සෞඛ්‍යය සහ ආර්ථික අභියෝග සඳහා රජය විසින් ලබා දෙන වේගවත් ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම සඳහා නිල නොවන "පුරවැසි විමසුමක්" ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රතිපත්ති ගැටලු සඳහා මහජන කථිකාවක් ප්‍රවර්ධනය කිරීම, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම; ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් වලට බලපෑම් කරන අන්දමින් පැනනඟින ගැටලු වලට පුරවැසියන්ට කාලෝචිත සහ සාධක හේතු කරගත් තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීමට මෙන්ම පුරවැසියන් හට පශ්චාත්- වසංගත සන්දර්භය තුළ තමන්ගේ අවශ්‍යතාවන්, උද්වේගයන් සහ අපේක්ෂාවන් ගෙනහැර දැක්වීමට හැකිවන අවශ්‍යතා ඇගයීමක් දියත් කිරීමට බලාපොරොත්තු වෙයි.

මෙම වාර්තාව ලියා ඇත්තේ මයිකල් මෙන්ඩිස් විසින් මෙම ව්‍යාපෘතිය සඳහා දායකත්වයක් ලෙසය. නීතිය හා සමාජ භාරය විසින් ඔවුන් මෙම ව්‍යාපෘතියට සම්බන්ධවීම අගය කරනු ලබයි. ලිපිය තුළ දක්වා ඇති අදහස් කිසිසේත්ම නීතිය හා සමාජ භාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ කළමනාකාරීත්වයේ අදහස් පිළිඹිබු නොකරයි.

**පිටකවරය නිර්මාණය: සංගීත් මදුරාවල විසිනි**

# කෝවිඩ් කාලය තුළ අධ්‍යාපනයේ සාධාරණත්වය ගැන කතා කරමු

ලොව පුරා දරුවන්ගේ අධ්‍යාපනය, කොවිඩ්-19 වසංගතය නිසා සිදු වූ විශාලතම හානිවලින් එකකි. 2020 මාර්තු මැද භාගයේදී වසංගතය ලොවම ගිලගත් විට, දකුණු ආසියානු කලාපයේ සියලුම රටවල් පාහේ ඔවුන්ගේ ජනගහනය අතර රෝගය පැතිරීමත් සමඟ පාසල් වසා දැමීමේ තීරණ ප්‍රකාශයට පත් කළේය.[1]

ශ්‍රී ලංකාවේ ද, දේශීයව හඳුනාගත් පළමු සිද්ධිය පිළිබඳ ආරංචිය ලැබුණු විගස, රෝගියාගේ පුතාට ද රෝගය වැළඳී ඇති බවට කටකතා පැතිර ගිය අතර, එම නිසා ඔහුගේ පාසලේ සිසුන්ගේ දෙමාපියන් පාසලට ඇතුල් වන ස්ථානයේ කෑකෝගසමින් දරුවන් පාසලෙන් ගෙන යන්නට ඉල්ලා සිටිමින් උද්ඝෝෂණ කළහ.[2]

සෞඛ්‍ය නිලධාරීන් කඩිනමින් ක්‍රියාත්මක වී අදාළ සිසුවා පරීක්ෂා කර ඔහු ආසාදිත නොවන බව තහවුරු කර ඇත. මෙය එසේ වුවද, බිය සැක පුළුල් ලෙස පැතිරී ගියේ දිනක් ඇතුළත, දිවයිනේ සියලුම රජයේ පාසල් වසා දමන බව අධ්‍යාපන අමාත්‍යාංශය නිවේදනය කිරීමට හේතු වෙමින්ය.[3] අනෙකුත් පාසල් ද එය අනුගමනය කළේය

මෙම තීරණය ප්‍රකාශයට පත් කරන විට, එය අප්‍රේල් නිවාඩුව කලින් ආරම්භ කිරීමේ ස්වරූපයක් ගත් අතර පාසල් ඊළඟ මාසයේ 20 වන දින නැවත විවෘත කිරීමට නියමිතව තිබුණි. නමුත් සිදු වූ දෙය නම් බොහෝ සිසුන්ට අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ හැකියාව අහිමි වී ඊළඟ වසර දෙකේ වැඩි කාලයක් නිවසේ රැඳී සිටීමය.

## *පූර්ව කෝවිඩ් සමයෙහි අධ්‍යාපනයේ විෂමතා*

අනෙකුත් කලාපීය සගයන් හා සසඳන විට ශ්‍රී ලංකාවේ ඉහළ සාක්ෂරතා මට්ටමක් තිබුනද , අධ්‍යාපන ක්‍රමයේ විෂමතා මුල් බැසගෙන දිගුකාලීනව පවතී. මෙම පෙර පැවති විෂමතා ගවේෂණය කිරීමට සහ විස්තර කිරීමට බොහෝ ක්‍රම තිබේ. කෙසේ වෙතත්, මෙහි අරමුණු සඳහා මෙම සාකච්ඡා පත්‍රිකාව මූලික වශයෙන් වාර්ෂික පාසල් සංගණනයේ ප්‍රධාන දත්ත මත රඳා පවතී.

2020 අවසන් වන විට ශ්‍රී ලංකාවේ රජයේ පාසල් 10,155ක් තිබී ඇත.[4] මේවා ප්‍රධාන පාසල් වර්ග තුනකට බෙදා ඇත. පළමු වර්ගයේ පාසල් උසස් පෙළ දක්වා පන්ති පවත්වයි. දෙවන වර්ගයේ පාසල් සාමාන්‍ය පෙළ දක්වා පන්ති පවත්වයි. තුන්වන වර්ගයේ පාසල් 5 වසර හෝ 8 වසර දක්වා පන්ති පවත්වයි.

ශ්‍රී ලංකාවේ මුළු රජයේ පාසල්වලින් 72%ක් පමණ (එනම් 7,223ක්) පාසල් උසස් පෙළ සඳහා පන්ති නොපැවැත්වීය (ඒවා 2 හෝ 3 වර්ගයේ පාසල් විය). උසස් පෙළ පන්ති පිරිනමන පාසල් (2,932) අතුරින් විද්‍යා විෂය ධාරාවන් සඳහා (එනම්, ජීව සහ/හෝ භෞතික විද්‍යා) පන්ති පැවැත්වූයේ පාසල් 1,000ක් පමණි.

2020 දී ශ්‍රී ලංකාවේ පාසල්වලින් බහුතරයක් තෙවන වර්ගයේ පාසල් වූ අතර, එම ප්‍රමාණය 3,999 කි. මෙම කාණ්ඩය තුළ 1 වසර සිට 5 වසර දක්වා පන්ති පවත්වන පාසල් 3,884 ක් සහ 1 සිට 8 වසර දක්වා පන්ති පවත්වන පාසල් 115 ක් විය.

නිල සංඛ්‍යාලේඛනවලට අනුව, 2020 දී 1 වසරට සිසුන් 319,405 ක් ඇතුළත් කර ඇත. ඔවුන්ගෙන් 40% ක් තුන්වන වර්ගයේ පාසල්වලට ඇතුළත් කර ඇත. එනම් සිසුන් 130,009 කි. පෙර වසර දෙකේදීම (එනම්, 2018 සහ 2019) 1 වසරට ඇතුළත් වූ සිසුන්ගෙන් 40% ක් ගියේ 3 වර්ගයේ පාසල්වලට ය. මෙයින් අදහස් කරන්නේ සෑම වසරකම 1 වසරට ඇතුළත් කර ගන්නා සිසුන්ගෙන් 40% ක් වසර 5 හෝ 8 කට පසු වෙනත් පාසලක් සොයා ගත යුතු බවයි.

---

[1] දකුණු ආසියාව සඳහා UNICEF ප්‍රාදේශීය කාර්යාලය කෝවිඩ්-19 තත්ව වාර්තාව අංක 2 මාර්තු 10 - 17, 2020 - ලෝකය | ReliefWeb (17.3.2020)

[2] මුළු රෝගීන් 2 දක්වා ඉහළ යද්දී රජය කෝවිඩ්-19 වැළැක්වීමේ පියවර දැඩි කරයි | ඩේලි එෆ්.ටී. (13.3.2020)

[3] රජයේ පාසල් හෙට සිට අප්‍රේල් 20 දක්වා වසා දමයි (newsfirst.lk) (12.3.2020)

[4] අධ්‍යාපන අමාත්‍යාංශය, 'ශ්‍රී ලංකාවේ වාර්ෂික පාසල් සංගණනය - 2020', https://moe.gov.lk/wp-content/uploads/2020/08/cenreport.pdf (ප්‍රවේශය 18.1.2022) හරහා ලබා ගත හැක. මෙතැන් සිට, පාසල් සංගණනය 2020 ලෙස දක්වයි. 2021 සඳහා සංඛ්‍යාලේඛන මෙය ලියන විට නොතිබුණි.

කෙසේ වෙතත්,ශ්‍රී ලංකාවේ පාසල්වලින් බහුතරයක් තුන්වන වර්ගයේ පාසල් වුවද, ශිෂ්‍ය ජනගහනයෙන් බහුතරය ඒවාට ඇතුළත් නොවේ. 2020 වසරේ මුළු ශිෂ්‍ය ජනගහනයෙන් 17%ක් පමණ තුන්වන වර්ගයේ පාසල්වලට සහභාගි විය. මෙයට හේතුව ශ්‍රී ලංකාවේ බොහෝ පාසල් තුන්වන වර්ගයේ පාසල් වුවද, ඒවා ධාරිතාවෙන් කුඩා බැවිනි. දිවයින පුරා විසිරී ඇති මේවා සාමාන්‍යයෙන් විශාල ශිෂ්‍ය සමූහයකට ඉඩකඩ නැත. තුන්වන වර්ගයේ පාසල්වලින් බහුතරයක (එනම්, 3,999 න් 1,317ක්) 2020 දී සිසුන් 50කට වඩා අඩු සංඛ්‍යාවක් ඇතුළත්ව සිට ඇත. තුන්වන වර්ගයේ සියලුම පාසල්වලින් 46ක් පමණක් සිසුන් 1000කට වඩා වැඩි ප්‍රමාණයක් ඇතුළත්ව සිට ඇත.

අනෙක් අතට, පාසල්වලින් 9% ක පමණ (එනම් පාසල් 930 ක්) එකවර සිසුන් 1,000 කට වඩා වැඩි ප්‍රමාණයක් ඇතුළත්ව සිට ඇති අතර, මෙම පාසල් සමහරකට වරකට සිසුන් 4,000 කට වඩා වැඩි ප්‍රමාණයකට ඉඩකඩ ඇත. පුදුමයට කරුණ නම් 2020 හි මුළු ශිෂ්‍ය ජනගහනයෙන් 43.2% ක් ඇතුළත් වූයේ මෙවන් පාසල්වලටය. වෙනත් වචන වලින් කිවහොත්, සමස්ත ශිෂ්‍ය ජනගහනයෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් ඉතා විශාල පාසල් කුඩා සංඛ්‍යාවක සංකේන්ද්‍රණය වී සිටියදී, ඉතිරි ශිෂ්‍ය ජනගහනය ඉතා කුඩා පාසල් විශාල සංඛ්‍යාවක විසිරී ඇත.

ශ්‍රී ලංකා රජයේ පාසල්වල තවත් වැදගත් වර්ගීකරණයක් වන්නේ ජාතික/පළාත් වෙනසයි. ජාතික පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සෘජුවම පරිපාලනය කරනු ලැබේ (එමගින් වැඩි සම්පත් සඳහා සෘජු ප්‍රවේශය ඇත). අනෙකුත් සියලුම පාසල් "පළාත් පාසල්" ලෙස හඳුන්වනු ලබන අතර ඒවා පරිපාලනය කරනු ලබන්නේ පළාත් පාලන ආයතන විසිනි. 2020 වසරේ පැවති මුළු රජයේ පාසල් 10,155 න් පාසල් 373 ක් "ජාතික" ලෙස වර්ග කර ඇත. මෙයින්, පාසල් 372ක් පළමු වර්ගයේ පාසල් වුණු අතර (එනම්, උසස් පෙළ දක්වා පන්ති පවත්වයි) 1 පාසලක් දෙවන වර්ගයේ පාසලක් විය (එනම්, සාමාන්‍ය පෙළ දක්වා පන්ති පවත්වයි). 2020 දී තුන්වන වර්ගයේ ජාතික පාසල් නොතිබුණි. පෙර සඳහන් කළ පරිදි, එකවර සිසුන් 1,000 කට වඩා වැඩි ප්‍රමාණයකට අධ්‍යාපනය ලබා දීමේ හැකියාව ඇත්තේ සියලුම පාසල්වලින් 9% කට පමණ වන අතර සෑම ජාතික පාසලකම පාහේ එවැනි ධාරිතාවක් ඇත. 2020 වසරේ පළමු වසරට ඇතුළත් කර ගැනීම්වලින් ජාතික පාසල්වලට ඇතුළත් කරගනු ලැබුවේ 8%ක් පමණි.

වාර්ෂික පාසල් සංගණනය මගින් නිරීක්ෂණය කරන තවත් වැදගත් දර්ශකයක් වන්නේ රජයේ සියලු පාසල්වල ගුරුවරුන්ගේ ව්‍යාප්තියයි. මෙහිදී, සියලුම ජාතික පාසල්වලින් 95%කට ගුරුවරුන් 50කට වඩා සිටිය දී, සියලුම පළාත් පාසල්වලින් 93%ක සිටියේ ගුරුවරුන් 50ට අඩු සංඛ්‍යාවකි. සමස්තයක් ලෙස ගත් කල, සියලුම රජයේ පාසල්වලින් 89%ක සිටියේ ගුරුවරුන් 50ට අඩු සංඛ්‍යාවකි.

ගුරුවරුන්ට අදාළ පත්වීම් ප්‍රධාන කාණ්ඩ පහකි. ඒවා පහත පරිදි වේ[5]:

- *උපාධිධාරී ගුරුවරුන්* - මූලික උපාධිධාරීන්, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන්, පශ්චාත් උපාධිධාරීන්
- *පුහුණු ගුරුවරුන්* - පුහුණු විද්‍යාලයකින් ගුරු-පුහුණු සහතිකය මගින් සුදුසුකම් ලැබූ ගුරුවරුන්/ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක ජාතික ඩිප්ලෝමාධාරීන්/ විද්‍යාව හෝ ගණිතය පිළිබඳ අවුරුදු 2ක ඩිප්ලෝමාවක් ඇති ගුරුවරුන්
- *නුපුහුණු ගුරුවරුන්* - නුපුහුණු ගුරුවරුන් සහ වසර 2-3 ක අනෙකුත් ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් කර ඇත.
- *අභ්‍යාසලාභී ගුරුවරුන්* - ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් නොකළ ගුරුවරුන්
- *වෙනත් ගුරුවරුන්* - වෙනත් රජයේ ආයතනවලින් වැටුප් ලබන ගුරුවරුන් සහ රාජ්‍ය නොවන ආයතන/සංවිධානවලින් වැටුප් ලබන ගුරුවරුන්

සාමාන්‍යයෙන් මෙම කාණ්ඩ ඉදිරිපත් කර ඇති අනුපිළිවෙල මගින් අනෙක් ඒවාට සාපේක්ෂව එක් එක් කාණ්ඩයේ උසස් බව සහ වැටුප් ශ්‍රේණිය පිළිබිඹු කරයි.

2020 දී, ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ඉගැන්වූ මුළු ගුරුවරුන් ගණන 249,494 කි. මෙයින් 48.7%ක් උපාධිධාරී ගුරුවරුන් ලෙස වර්ගීකරණය කර ඇත. මුළු උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාවෙන් 66%ක් පළමු වර්ගයේ පාසල්වල (උසස් පෙළ දක්වා වසර ඇති පාසල්වල) සේවයේ යොදවා ඇති අතර, උපාධිධාරී ගුරුවරුන්ගෙන් 10%ක් වැනි ගණනක් පමණක් තුන්වන වර්ගයේ පාසල්වලට (1-5 හෝ 1-8 වසර සහිත පාසල්වල) පත්වීම් ලබා දී ඇත.

සිසුන් සංඛ්‍යාව හා පාසලේ ගුරුවරුන් සංඛ්‍යාව සංසන්දනය කරන ශිෂ්‍ය-ගුරු අනුපාතය අධ්‍යාපන සන්දර්භය තුළ වැදගත් දර්ශකයකි. අඩු අනුපාතයක් යනු සාමාන්‍යයෙන් ගුරුවරයෙකුට තම පන්තියේ තනි

[5] පාසල් සංගණනය 2020 (*ඉහත*) බලන්න. මෙම නිර්වචන පාසල් සංගණන වාර්තාවේ එලෙසම සඳහන් වේ.

සිසුවෙකුට වැඩි කාලයක් අවධානය ලබා දීමට හැකියාව ලැබීමයි. ඉහළ අනුපාතයක් යනු එහි විලෝමයයි. ගුරුවරයෙකුට තම පන්තියේ තනි සිසුවෙකුට අවධානය ලබා දිය හැකි කාලය අඩු වීමයි. පළමු වර්ගයේ සහ තුන්වන වර්ගයේ පාසල් අතර ශිෂ්‍ය-ගුරු අනුපාතය සලකා බැලීමේදී, උපාධිධාරී ගුරුවරුන්ගේ තුන්වන වර්ගයේ පාසල්වල ව්‍යාප්තියෙහි විෂමතාවයක් ඇති බව පැහැදිලිය. ඒ කෙසේ ද යත් 2020 දී පළමු වර්ගයේ පාසල්වල එක් උපාධිධාරී ගුරුවරයෙකුට සිසුන් 32.8 ක් සිටි අතර තුන්වන වර්ගයේ පාසල්වල එක් උපාධිධාරී ගුරුවරයෙකුට සිසුන් 49.9 ක් සිටියහ.

මේ අනුව, 2020 දී, උපාධිධාරී ගුරුවරුන්, සම්පත් හොඳින් ලැබෙන පළමු වර්ගයේ පාසල්වල අධික ලෙස සංකේන්ද්‍රණය වී ඇති අතර තුන්වන වර්ගයේ පාසල්වල උපාධිධාරී ගුරුවරුන් අඩු සංඛ්‍යාවක් සිටිහෙයින් සාපේක්ෂ ලෙස විශාල සිසුන් සංඛ්‍යාවක් අතර ඔවුන්ව බෙදා ගැනීමට ද සිදුව ඇත. ඇත්ත වශයෙන්ම සිදු වන්නේ තුන්වන වර්ගයේ පාසල් එක් පාසලකට වඩා සංඛ්‍යාවක් අතර බොහෝ විට පාසල් සතියක් තුළ ගුරුවරුන් මාරුවෙන් මාරුවට යෙදවීමයි. උසස් පෙළ පන්ති සපයන පාසල්වල උපාධිධාරී ගුරුවරුන් වැඩි ගණනක් අවශ්‍ය වන බව සැබෑය. කෙසේ වෙතත්, විවිධ වර්ගයේ පාසල්වලට ලැබෙන විවිධ මට්ටම්වල සැලකීම් සලකා බැලීමේදී, රජය ඔවුන් සතු වඩාත්ම සුදුසුකම් ලත් ගුරුවරුන් බෙදා හැරීමේදී ප්‍රමාණවත් තුලනයක් පවත්වා ගන්නේදැයි කෙනෙකුට ප්‍රශ්න කිරීමට සාධාරණ හේතු ඇත. පවත්නා තත්වය අනුව පාසල් සංගණන දත්ත මගින් පමණක් මෙම ප්‍රශ්නයට පිළිතුරක් සොයාගත නොහැකිය.

ඉහත විග්‍රහයෙන් අපේක්ෂා කරන්නේ වසංගතය පැතිරීමට පෙර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ පවතින විෂමතා පිළිබඳ සාමාන්‍ය චිත්‍රයක් ඇඳීමයි. එම විශ්ලේෂණය තුළ පාසල් පද්ධතියට අදාළ සාධක තුනක් සලකා බලයි - පාසල්වල සාපේක්ෂ ධාරිතාවන් සහ ශිෂ්‍ය ජනගහනය ඒවා හරහා විසිරී ගිය ආකාරය; ජාතික/පළාත් භේදය පාසල් ධාරිතාව සහ ශිෂ්‍ය ව්‍යාප්තිය යන ප්‍රශ්නය හරහා විහිදෙන ආකාරය; සහ අවසාන වශයෙන්, විවිධ වර්ගයේ පාසල් හරහා සුදුසුකම් ලත් ගුරුවරුන් බෙදා හැරීම (සහ එහි සාධාරණත්වය).[6] සාරාංශයක් ලෙස, ශ්‍රී ලංකාවේ සමස්ත ශිෂ්‍ය ජනගහනයෙන් විශාල කොටසක් මුළු පාසල් ගණනින් 9% ක සංකේන්ද්‍රණය වී ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සෘජුව පාලනය වන ජාතික පාසල් සියල්ලම පාහේ ඊට ඇතුළත් බව පැහැදිලිය. මෙම පාසල් වැඩිම උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාවකගේ සේවය ද භුක්ති විඳී. මේ අතර, මුළු පාසල් ගණනින් විශාලතම ප්‍රතිශතයක් දිවයින පුරා විසිරී ඇති අතර ප්‍රමාණයෙන් ඉතා කුඩා මෙම පාසල් අදාළ පළාත් පාලන ආයතන විසින් පරිපාලනය කරනු ලැබේ. ඒවාහි 5 හෝ 8 වසර දක්වා පමණක් පන්ති ඇතුළත් වන අතර, උපාධිධාරී ගුරුවරුන් ඉතා අඩු සංඛ්‍යාවක් සේවයේ නියැලේ. පාසල් සංගණන දත්ත මගින් විවිධ වර්ගයේ පාසල්වලට ඇතුළත් වන සිසුන්ගේ සමාජ-ආර්ථික තොරතුරු සපයන්නේ නැතත්, මෙය අධ්‍යයනය කළ හැකි නම් එය ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. විශේෂයෙන්ම විවිධ වර්ගයේ පාසල්වලට යන සිසුන්ගේ ආදායම් මට්ටම්, වෘත්තීය පසුබිම්, සහ කුල අනන්‍යතා පිළිබඳ පැවතිය හැකි රටාවන් නිර්ණය කිරීමට එය වැදගත් වනු ඇත.

ශ්‍රී ලංකාව තුළ "ජනප්‍රිය" පාසල් සංසිද්ධිය ප්‍රකට කරුණකි. 2021 පෙබරවාරි 13 වැනි දින ශ්‍රී ලංකා අධ්‍යාපන සංසදය (EFSL) විසින් "පාසල්වලට මුදල් ලබා දීමේ විෂමතා" මැයෙන් සිදු කළ මාර්ගගත ප්‍රතිපත්ති සංවාදයක් හරහා මෙම සංසිද්ධිය විස්තරාත්මකව නිරූපණය කරන ලදී.[7] මෙම සාකච්ඡාවට අනුව, සිසුන් 350 ක් පමණ සිටින දෙවන වර්ගයේ නිදර්ශක පාසලකට (1-11 වසර) පාසලේ අත්‍යවශ්‍ය ඕනෑ එපාකම් ආවරණය කිරීම සඳහා රුපියල් 250,000 ක වාර්ෂික අයවැයක් අවශ්‍ය වනු ඇත. කෙසේ වෙතත්, මෙම මුදලින් 5-8% ක් පමණ සෘජුවම රජය විසින් ආවරණය කරනු ලබන අතර, තවත් කොටසක් විදුහල්පතිවරයාගේ විශේෂ ඉල්ලීම් මත පදනම්ව රජය විසින් සපයනු ලැබේ (එනම්, මෙම කොටස සියලුම පාසල් සඳහා ලැබෙන්නේ යැයි සහතිකයක් නැත). අත්‍යවශ්‍ය දෑ සඳහා වාර්ෂික අයවැයෙන් වැඩි කොටසක් ශිෂ්‍ය සංවර්ධන සමිතියේ සහ මාපිය දායකත්වයෙන් ආවරණය කෙරේ. පාසලේ විශේෂ අවශ්‍යතාවන්ට, උදා: විෂය බාහිර ක්‍රියාකාරකම්, ශිෂ්‍ය සහ ගුරු සංවර්ධනය යනාදිය සඳහා පාසලට රජයෙන් මුදල් නොලැබුණු අතර ඒවා ප්‍රජාව අතරින් අරමුදල් රැස්කිරීමට විදුහල්පතිට ඇති හැකියාව මත රඳා පැවතුනි. සමහර පාසල් හැකියාවක් ඇත්නම් එයට අයත් දේපළ කුලියට දීමෙන් ද ආදායම් උපයා ගනී. ඊට හාත්පසින්ම වෙනස්

---

[6] මෙම විශ්ලේෂණය උපාධිධාරී ගුරුවරුන් පමණක් සලකනු ලැබුවද, මෙය කිසිසේත්ම පුහුණු/නුපුහුණු/අභ්‍යාසලාභී ගුරුවරුන් නුසුදුස්සන් හෝ ප්‍රමාණවත් ලෙස සුදුසුකම් නොමැති අය ලෙස නිරූපණය කිරීමක් ලෙස අදහස් නොකෙරේ. ඒ වෙනුවට, උපාධිධාරී ගුරු ව්‍යාප්තියේ සාධාරණත්වය සමස්ත ගුරු ව්‍යාප්තියේ සාධාරණත්වය පිළිබඳ ඇඟවීමක් ලෙස සලකනු ලැබේ.

[7] ශ්‍රී ලංකා අධ්‍යාපන සංසදය , බලන්න, 'ප්‍රතිපත්ති සංවාදය #12: පාසල්වලට මුදල් ලබා දීමේ විෂමතා ' (13.2.2021), https://educationforum.lk/2021/02/policy-dialogue-12-inequities-in-funding-schools/ හරහා ලබා ගත හැක (ප්‍රවේශය 25.1.2022) (ප්‍රතිපත්ති සංවාද වීඩියෝව අන්තර්ගතයි.)

ලෙස, එම සාකච්ඡාවට සහභාගී වූ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයෙකු වාර්තා කළේ එම පාසලේ වාර්ෂික මෙහෙයුම් අයවැය පමණක් සාමාන්‍යයෙන් රුපියල් මිලියන 200කට ආසන්න වන බවයි.

එවැනි පසුබිමක් තුළ ජනප්‍රිය පාසලක ස්ථානයක් ලබා ගැනීම සඳහා 5 වසර ශිෂ්‍යත්වය හරහා අවුරුදු 10 වැනි කුඩා දරුවන්ට අතිමහත් පීඩනයක් එල්ල වේ. බොහෝ මවුපියන් අතර පවතින සාම්ප්‍රදායික නුවණ අනුව "ජනප්‍රිය" පාසලක ස්ථානයක් ලබා ගන්නා අයට පවා දීප්තිමත් අනාගතයක් අනිවාර්යය ලෙස උදා වේ යැයි සහතිකයක් නැතිමුත්, "ජනප්‍රිය" පාසලක ස්ථානයක් ලබා ගැනීමට අපොහොසත් වන අනෙක් සියල්ලන්ටම අවාසනාවන්ත ඉරණමක් නියතය යන්නයි. මෙය සත්‍ය වුවත් නැතත්, පාසල් සංගණනය සමීපව විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ පාසල් පද්ධතිය තුළ සම්පත් බෙදා හැරීමේ පිරමිඩාකාර ව්‍යුහය පිළිබඳව අධ්‍යාපන පද්ධතිය දැනුවත්ව සිටිනවා පමණක් නොව, ජනප්‍රිය පාසලක ඉඩක් ලබා ගැනීමේ වැදගත්කම බොහෝ ආකාරවලින් තහවුරු කරන බවයි. මෙය සිදුවන්නේ දේශපාලනඥයන් ඔවුන්ගේ ප්‍රසිද්ධ මන්තරය වන "ළඟම පාසල හොඳම පාසල" ලෙස නිතරම පුන පුනා කියන අතරමය.

## ***කොවිඩ් සමයේ අධ්‍යාපනය සහ අඛණ්ඩව පවතින විෂමතා***

වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස පාසල් වැසීම සහ "මාර්ගගත අධ්‍යාපනය" වෙත ගෙන යාම, ඉහත විස්තර කර ඇති අධ්‍යාපනික සන්දර්භයට විෂමතාවන්හි නව මානයන් එක් කළේය.

*දුරස්ථ අධ්‍යාපනය*

"මාර්ගගත අධ්‍යාපනය" වෙත අධ්‍යාපනය ගෙන යාමට ආණ්ඩුවේ තීරණය ප්‍රකාශයට පත් කළද, මෙම නව ප්‍රවේශයේ ක්‍රමවේද පිළිබඳව එහි කිසි විටෙකත් නිශ්චිත අදහසක් නොවීය. මුලදී, අධ්‍යාපන අමාත්‍යාංශය එහි නිත්‍ය මාර්ගගත ඉගෙනුම් වේදිකාව වන "ඊ-තක්සලාව" හරහා මෙන්ම රූපවාහිනී නාලිකාවල අධ්‍යාපනික වැඩසටහන් යෙදවීය. ඊ-තක්සලාව වේදිකාව 2013 දී දියත් කර ඇති අතර, 1 සිට 13 වසර දක්වා අදාළ විවිධ පාඩම් සඳහා සිසුන්ට මාධ්‍ය තුනෙන්ම ප්‍රවේශය ලබා දී ඇත. වසංගත කාලසීමාව තුළ ඕනෑම අන්තර්ජාල සේවා සපයන්නෙක් හරහා එම වේදිකාවට නොමිලේ ප්‍රවේශය ලබා දීමට ආණ්ඩුව පියවර ගත්තේය.[8] 2020 අප්‍රේල් මාසයේදී චැනල් අයි සහ නේත්‍රා යන පොදු රූපවාහිනී නාලිකා දෙකෙහි අධ්‍යාපනික වැඩසටහන් ද අමාත්‍යාංශය විසින් දියත් කරන ලදී. පුවත්පත්වල කාලසටහනක් පළ කරමින් එම රූපවාහිනී වැඩසටහන් උසස් පෙළ, සාමාන්‍ය පෙළ සහ 5 වසර ශිෂ්‍යත්ව සිසුන්ට පාඩම් ලබා දුන්නේය.[9] කෙසේ වෙතත්, මෙම ප්‍රවේශ දෙකම ප්‍රමාණවත් නොවීය. මාර්ගගත ඉගෙනුම් වේදිකාව සෑම විටම සාම්ප්‍රදායික ඉගැන්වීම් ප්‍රවේශයට අතිරේකයක් ලෙස අරමුණු වූවක් වන අතර පන්තිකාමර ඉගෙනීම ප්‍රතිස්ථාපනය කිරීමට හෝ ආදේශ කිරීමට සුදුසු නොවීය. අනෙක් අතට, රූපවාහිනියේ විකාශනය කරන ලද අධ්‍යාපන වැඩසටහන් නිශ්චිත ශ්‍රේණි තුනකට පමණක් සපයනු ලැබූ අතර, එය වුවද, සතිපතා රූපවාහිනී කාලසටහනක කාල සීමාව තුළ එක් ශ්‍රේණියකට විෂයයන් බොහෝ ප්‍රමාණයක් ඇතුළත් කිරීමට සිදු විය. ඊට අමතරව, ඊ-තක්සලාව වේදිකාව සියලු සිසුන්ට අන්තර්ජාලයට ප්‍රවේශය ඇතැයි උපකල්පනය කරන අතර, රූපවාහිනියෙන් ලබා දුන් පාඩම් උපකල්පනය කළේ සියලු සිසුන්ට රූපවාහිනියෙන් උගන්වන පාඩම් සමඟ සම්බන්ධ වීමට සහ අවධානය යොමු කිරීමට අවශ්‍ය පරිසරය ඇති බවයි. මෙම පියවරයන්ට අමතරව, පුද්ගලික රූපවාහිනී නාලිකා මෙන්ම ගාස්තු අය කරන රූපවාහිනී සේවා (ඩයලොග් TV සහ පියෝ TV වැනි) ද අධ්‍යාපනික අන්තර්ගතයන් ඉදිරිපත් කළහ.

මේ අතර, ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සියළුම වසරවල තම සිසුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා තමන්ගේම ක්‍රම සැකසීමට පටන් ගත්හ. මෙම ක්‍රමවලට කණ්ඩායම් ඇමතුම් හෝ සූම් රැස්වීම් හරහා පන්ති ඉගැන්වීම, පණිවිඩ හුවමාරු ඇප් හරහා පාඩම්වල වීඩියෝ පටිගත කිරීම් යැවීම, විද්‍යුත් තැපෑලෙන් PDF ලෙස සටහන් යැවීම, මාර්ගගත ප්‍රවේශය නොමැති අයට මුද්‍රිත සටහන් ලබා දීම, දුරකථන ඇමතුම් හරහා මෙන්ම සිසුන් හමු වී පවා ඔවුන්ගේ පාඩම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම යන ක්‍රමවේදයන් ඇතුළත් විය. මෙම පියවරයන් සමඟ වුවද, 2020 මැයි මාසය වන විටම, බොහෝ පවුල් තම දරුවන්ගේ අධ්‍යාපනය ඉදිරියට ගෙන යාමේදී මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ ප්‍රවෘත්ති වාර්තා මතු වීමට පටන් ගත්තේය.[10] බොහෝ පවුල්වලට මාර්ගගත අධ්‍යාපනයට ඇති ලොකුම බාධාව වූයේ අන්තර්ජාලයට ප්‍රවේශය නොමැතිකමයි. එක් මට්ටමකින්, එය උපාංග පිළිබඳ ගැටලුවක් විය. සමහර පවුල්වලට දරුවට මාර්ගගත අධ්‍යාපනයේ

---

[8] ශ්‍රී ලංකාව: දත්ත ගාස්තුවකින් තොරව සිසුන් සඳහා නොමිලේ ඊ-තක්සලාව වෙත අන්තර්ජාල ප්‍රවේශය (colombopage.com) (25.3.2020)

[9] අධ්‍යාපන නාලිකා කාලසටහන නිවේදනය කරයි | ඩේලි නිව්ස් (28.4.2020)

[10] උදා.,"පාසල් දරුවන් සිටින පවුල්වලින් 66%කට ඉන්ටර්නෙට් නෑ" : ශ්‍රී ලංකාවේ ඔන්ලයින් අධ්‍යාපනය සාර්ථක වෙයි ද? - BBC News සිංහල බලන්න (20.5.2020)

නියැලීමට තරම් උසස් මට්ටමක (3G හෝ ඊට වඩා පහසුකම් සහිත) අන්තර්ජාලයට පිවිසීමේ හැකියාවක් ඇති එකදු උපාංගයක් නොතිබුණි. අනෙක් අතට, සමහර පවුල්වලට ප්‍රමාණවත් උපාංග නොතිබුණි. සහෝදර සහෝදරියන් වැඩි ගණනක් සිටින නමුත් පවුලේ එක් උපාංගයක් පමණක් ඇති දරුවන්ට එකවර මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශ විය නොහැකි විය. සමහර දරුවන්ට තම දෙමාපියන්ගේ රැකියා කටයුතු සිදු කරන ලැප්ටොප් හෝ දුරකථන මත යැපෙන්නට සිදු වූ අතර, නිවසේ සිට වැඩ කිරීම සිදු වූ දෙමාපියන්ටද එම උපාංග භාවිතා කරන්නට අවශ්‍ය විය. අනෙක් අතට, උපාංග තිබෙන තැන පවා, සාමාන්‍ය කාලවලදී පවා මිල අධික වන දත්ත වලට වැයවෙන වියදම දරාගත නොහැකි විය. වසංගත කාලය තුළ, ජීවනෝපායන් අහිමි වීම හෝ වැටුප් කප්පාදු කිරීමත් සමඟ, එය තවදුරටත් දරාගත නොහැකි තරම් තත්වයකට පත් විය. ඇත්ත වශයෙන්ම, එක් පූර්ව-කෝවිඩ් අධ්‍යයනයකට අනුව, ජනගහනයෙන් වඩා දුප්පත් 60% ට ඔවුන්ගේ මාසික ආදායමේ ප්‍රතිශතයක් ලෙස GB 1ක දත්ත ප්‍රමාණයේ පිරිවැය දරාගත නොහැකි විය.[11] විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ළමුන් මුහුණ දෙන ගැටලුවක් වූයේ සිග්නල ඌනතාවය හෝ හසුවෙන සිග්නල 3G හෝ ඊට වැඩි නොවීමයි. මෙම වකවානුවේදී, මාර්ගගත පන්තිවලට සහභාගී වීම සඳහා සිසුන් ස්මාර්ට්ෆෝන් සමඟ ගස් සහ ජල ටැංකිවලට නගින ඡායාරූප මාධ්‍ය පුරා පුළුල් ලෙස පැතිර ගියේය. බොහෝ විට උපුටා දැක්වෙන LIRNEasia විසින් කරන ලද අධ්‍යයනයකට අනුව දරුවන් සිටින කුටුම්භවලින් 34%කට පමණක් අන්තර්ජාල සම්බන්ධතාවක් ඇති අතර, දරුවන් සිටින කුටුම්භවලින් 48%කට පමණක් ස්මාර්ට් ජංගම දුරකතනයක් හෝ පරිගණකයක් තිබේ.[12]

*ගුරුවරුන්ට සහයෝගය*

මේ අතර, දුරස්ථ අධ්‍යාපන කාලය පුරාවටම ආණ්ඩුව කෙරෙහි ගුරුවරුන් අතර පැවති අතෘප්තිය වඩාත් නරක අතට හැරෙමින් 2021 අවසානය වන විට උනුසුම් තත්ත්වයකට පත් විය.[13] ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හරහා දිගු කලක් තිස්සේ ඔවුනට සිදු වන බරපතල අයුක්තියක් ලෙස සලකන වැටුප් විෂමතාවය විසඳීමට අරගල කරමින් සිටියහ.[14] වසංගතය ආරම්භයට පෙර වසර කිහිපය තුළ වෘත්තීය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වූ අතර, 2020 වර්ෂය සඳහා සැලසුම් කරන ලද එවැනි පළමු ක්‍රියාමාර්ගය යෙදුනේ කෝවිඩ්-19 හේතුවෙන් පාසල් අනපේක්ෂිත ලෙස වසා දැමූ මාර්තු 15න් ඇරඹි සතියයි.[15]

කෙසේ වෙතත්, ඔවුන්ගේ අතෘප්තිය නොතකා ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් තමන්ගේම මාර්ගගත ඉගැන්වීම් ක්‍රම සැකසීමට විශාල ලෙස පෙළඹීමක් දක්නට ලැබුනේ ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි අධ්‍යාපන නිලධාරීන්ගෙන් ඒ සඳහා එතරම් උනන්දුවක් නොමැති තත්වයක් මත බව හොඳින් ලේඛනගත කර ඇති කරුණකි.[16] එහෙත්, ඉතා ඉක්මනින් එම ගුරුවරුන්ට රජයේ සහාය අවශ්‍ය විය. රජයෙන් කිසිදු පුහුණුවක්, මගපෙන්වීමක් හෝ මූල්‍ය අනුග්‍රහයක් නොමැතිව මාර්ගගත අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන් දරන ලද වියදම්වල ප්‍රමාණය බීබීසී සිංහල සේවයේ වාර්තාවකින් විස්තර කෙරේ.[17] සතියකට බහුවිධ පන්ති සඳහා මාර්ගගත පාඩම් පැවැත්වීම හේතුවෙන් දරන්නට වූ ඉහළ දත්ත පිරිවැයට අමතරව, ඒ වන තෙක් තමන් සතුව නොතිබූ උපාංග (ලැප්ටොප් සහ ස්මාර්ට්ෆෝන් වැනි) ලබා ගැනීමේ වියදම් ගැන ද බොහෝ ගුරුවරුන් විස්තර කරති. සමහර ගුරුවරුන් සිය වියදමින් Zoom හෝ Microsoft Teams පැකේජ ලබා ගත්හ. සමහර ගුරුවරුන් ලොක්ඩවුන් කාලය තුළ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වූ අතර, මාර්ගගතව පාඩම් කියා

---

[11] අයේෂා සයිනුදීන් සහ තාරකා අමරසිංහ, 'ආසියානු ගෝලීය දකුණේ විද්‍යුත් ඉගෙනුම් අවස්ථා' *LIRNEasia* (19.5.2020), https://lirneasia.net/2020/05/e-learning-opportunities-in-the-asian-global-south-presentation/ හරහා ලබා ගත හැක (ප්‍රවේශය: 18.1.2022)

[12] LIRNEasia, *ප්‍රවේශයෙන් පසු: ආසියාවේ සහ ගෝලීය දකුණේ ICT ප්‍රවේශය සහ භාවිතය (3.0 අනුවාදය),* (කොළඹ, 2019).

[13] උදා., ගැටළුවලට විසඳුම් ඉල්ලා ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් දිවයින පුරා විරෝධතාවක (newsfirst.lk) (25.10.2021) බලන්න

[14] උදා., ගුරු - විදුහල්පතිවරු ලෙඩවීම සාර්ථකයි - ලංකා ගුරු සංගමය - Aruna (13.3.2019) බලන්න

[15] https://abcnews.go.com/Health/wireStory/latest-indias-coronavirus-cases-continue-daily-decline-73965144 සහ https://www.ips.lk/talkingeconomics/2021/06/07/mitigating-sri-lankas-covid-19-education-crisis-priority-areas-for-action/ බලන්න

[16] උදා., UNICEF, *ආසියාවේ අධ්‍යාපන අංශයට කෝවිඩ්-19 හි බලපෑම් සහ ප්‍රතිචාර පිළිබඳ තත්ව විශ්ලේෂණය: ශ්‍රී ලංකා සිද්ධි අධ්‍යයනය (අගෝස්තු 2021)*, පිටු අංක 28-29 බලන්න

[17] අඹු දරු රැකුමට ලැබෙන සොච්චම ඔන්ලයින් වලට වැය කළ දිසාපාමොක් ඇදුරු පරපුර - BBC News සිංහල (28.7.2021)

දීමට හැකි තරම් ප්‍රබල සිග්නල ලබා ගැනීමට ඔවුන්ට තම සිසුන් තරම්ම කරදර වන්නට සිදු විය. බොහෝ ගුරුවරුන්ට, හදිසියේ මාර්ගගත අධ්‍යාපනයට මාරුවීම සමඟ අපහසුතාවයට පත් වුණු තමන්ගේම දරුවන් සිටි අතර, තම සිසුන්ට ඉගැන්වීමට මෙන්ම තමන්ගේම දරුවන්ට ඉගෙන ගැනීමට උපකාර කිරීමට ඔවුන්ට ඇති අඩු සම්පත් බෙදීමට සිදු විය.

2021 මැද භාගය වන විට ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් නියෝජනය කරන ප්‍රධාන වෘත්තීය සමිති මහජන විරෝධතා සහ පෙළපාළි ඇතුළු වෘත්තීය ක්‍රියාමාර්ගවල බරපතල අදියරකට අවතීර්ණ වූයේ මෙම තත්වයතුළ ය. මෙම ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස, අපහසුකාරී වැටුප් විෂමතාවයකින් පෙළෙන අතරේ මාර්ගගත ඉගැන්වීම සඳහා දරන අසීමිත වියදම් හේතුවෙන් සහ මාර්ගගත ඉගැන්වීම ලෙස ගෙන යන නිරර්ථක වැඩසටහන නිසා දුප්පත් සිසුන්ට සිදු වූ අසාධාරණයන් හේතුවෙන් ගුරුවරුන් මාර්ගගත අධ්‍යාපනයෙන් ඉවත් වීමට පටන් ගත්හ.[18] අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් ඇතුළු විවිධ මර්දනකාරී උපක්‍රමවලට පවා යොමු වෙමින් වෘත්තීය සමිතිවල ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට තරම් රජය දැඩි ස්ථාවරයක එල්බ සිටියද නොවැම්බර් අයවැය කතාවේදී මුදල් ඇමැතිවරයා ඉතා පහසුවෙන් සහ ඔවුන්ගේ බලය ප්‍රදර්ශනය කරමින් වැටුප් විෂමතාවය විසඳුවේය.[19] කෙසේ වෙතත්, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා මෙම ප්‍රශ්නය විසඳාගත් පහසුව සැලකූ විට එය මීට බොහෝ කලකට පෙර විසඳා නොගත්තේ මන්දැයි කෙනෙකුට කුතුහලය දනවනු ඇත.

*පාසල් ආහාර වැඩසටහන්*

අධ්‍යාපනයට අදාළව වසංගතයේ ප්‍රධාන ප්‍රතිවිපාකයක් වන්නේ පාසල් වැසීම හේතුවෙන් ළමා පෝෂණයට ඇති කළ බලපෑමයි. ශ්‍රී ලංකාව 1931 තරම් ඈත කාලයේ සිට පාසල්වල ආහාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, වත්මන් ජාතික පාසල් ආහාර වැඩසටහන 2003 වසරේ සිට ක්‍රියාත්මක වේ. රජය වාර්ෂිකව රුපියල් බිලියන 5-6ක් පමණ එම වැඩසටහන සඳහා වැය කරන අතර එය රජයේ පාසල් 80% ක පමණ ක්‍රියාත්මක කරයි. එමෙන්ම සිසුන් මිලියන 1.1 ක් පමණ එහි ප්‍රතිලාභ ලබයි.[20] මෙම වැඩසටහන මඟින් සිසුන් 1000ට අඩු සියලුම පාසල්, තෝරාගත් පාසල්වල 1 සිට 5 වසරවල සිසුන්, සහ විශේෂ අධ්‍යාපන ඒකකවල සිසුන් ආවරණය කරයි. මෙම වැඩසටහනට අමතරව, රජය විසින් "අධ්‍යාපනය සඳහා ආහාර" ලෙස වැඩසටහනක් (ලෝක ආහාර වැඩසටහන සමඟ සහයෝගීව) මෙන්ම තෝරාගත් පාසල්වල සිසුන්ට නැවුම් කිරි බෙදා හැරීමේ යෝජනා ක්‍රමයක් ද ක්‍රියාත්මක කරයි. බොහෝ දරුවන්ට, ජාතික පාසල් ආහාර වැඩසටහන හරහා ලැබෙන ආහාර වේල ඔවුන්ගේ පෝෂණය සඳහා අත්‍යවශ්‍ය වන අතර, බොහෝ විට ඔවුන් දිනකට ලැබෙන පෝෂ්‍යදායීම ආහාර වේල වේ.[21]

කෙසේ වෙතත්, කෝවිඩ්-19 හේතුවෙන් පාසල් වසා දැමීමත් සමඟ සිසුන්ට මෙම ආහාර වේල අහිමි විය. ලෝක ආහාර වැඩසටහනේ අනුග්‍රහය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් "ආසන්න වශයෙන් පාසල් ළමුන් 78,000 කට"[22] මාසයක කාලයක් සඳහා නිවසට ගෙන යා හැකි සලාක ලබා දුන්නද, එම කර්තව්‍ය මගින් පෙර පාසල් ආහාර වැඩසටහන මත යැපුන මිලියන 1.1ක් පමණ වූ සිසුන්ගේ අවශ්‍යතාවයන්ට කෙසේවත් විසඳුමක් නොවූයේය. ළමුන් සහ නව යොවුන් වියේ දරුවන් අතර මන්දපෝෂණය දිගු කලක් තිස්සේ බරපතල මහජන සෞඛ්‍ය ගැටලුවක් වී ඇති තත්වයක් තුළ, පාසල් ආහාර වැඩසටහනට බාධා වීම බොහෝ ශ්‍රී ලාංකීය දරුවන්ගේ සෞඛ්‍යය පමණක් නොව, ඉදිරියේදී අධ්‍යාපනයට නැවත පැමිණීමට ඔවුන්ට ඇති හැකියාව ද අනතුරේ හෙලා ඇත. සාමාන්‍යයෙන් දුප්පතුන්ගේ දුප්පත්ම කොටසට අයත් වන මෙම දරුවන්ගේ දෙමාපියන්ට දැන් අන්තර්ජාලය හරහා අධ්‍යාපනයට පහසුකම් සැලසීමේ අමතර වියදම් පමණක් නොව, දරිද්‍රතාවය නිසාම ඔවුන් පාසලෙන් ලබා ගැනීමට පුරුදු වී සිටි පෝෂ්‍යදායී ආහාර වේලද දරුවන්ට ඔවුන්ටම ලබා දීමට යන වියදමද දැරීමට සිදු විය.

---

[18] ලංකා ගුරු සංගමයේ නායක ජෝසප් ස්ටාලින් දුප්පත් සිසුන්ට ඔන්ලයින් අධ්‍යාපන ප්‍රවේශයේ අසාධාරණය වසරකට පෙර පැහැදිලි කරයි: "පාසල් දරුවන් සිටින පවුල්වලින් 66%කට ඉන්ටර්නෙට් නෑ" : ශ්‍රී ලංකාවේ ඔන්ලයින් අධ්‍යාපනය සාර්ථක වෙයි ද? - BBC News සිංහල (20.5.2020) බලන්න

[19] මාස හයක සටන අවසන්. ගුරු විදුහල්පති අයවැයේ යෝජනාව පිලිගනී - ITN News දේශීය පුවත් (14.11.2021)

[20] ලෝක බැංකුව, *ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා රාජ්‍ය මූල්‍යය තක්සේරු කිරීම* (පෙබරවාරි 2020), https://openknowledge.worldbank.org/bitstream/handle/10986/33419/PER-for-Nutrition-in-Sri-Lanka-Assessing-Public-Financing-for-Nutrition-2014-2018.pdf?sequence=5 හරහා ලබා ගත හැක (ප්‍රවේශය 18.1.2022)

[21] වසංගතය ආරම්භයේ සිට පාසැල් ආහාර වේල් බිලියන 39 කට වැඩි ප්‍රමාණයක් මග හැරී ඇති බැවින් ළඟ එන පෝෂණ අර්බුදයක් - UNICEF සහ WFP (1.2.2021)

[22] *එහිම*

*විභාග*

2020 මාර්තු වන විටම, ජාතික මට්ටමේ විභාගවලට වසංගතයේ බලපෑම පිළිබඳ කටකතා මෙල්ල කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය යුහුසුළු විය.[23] මැයි මාසය වන විටත් උසස් පෙළ විභාග කල් නොයන බවට ආණ්ඩුව සිය ස්ථාවරය පුනරුච්චාරණය කරමින් සිටියේය.[24] කෙසේ වෙතත්, ජූනි මාසය වන විට, නිලධාරීන් අවසානයේ ස්ථාවරය ලිහිල් කොට, එළඹෙන උසස් පෙළ විභාග මෙන්ම 5 වසර ශිෂ්‍යත්ව විභාග සැප්තැම්බර් මාසයේ දිනයන්ට කල් තබන බව නිවේදනය කළහ.[25] කෙසේ වෙතත්, වැඩි කල් නොගොස් එවකට අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා එම දින නැවත සලකා බලමින් සිටිනු දක්නට ලැබුණේ විභාග තව දුරටත් කල් දමන ලෙස බොහෝ පාර්ශව කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් "උසස් පෙළ සිසුන්ගේ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ගේ යෝජනා සහ අදහස්" විභාග පැවැත්වීමට නියමිත දිනය තීරණය කිරීමේදී අමාත්‍යාංශය විසින් සලකා බැලෙන බවයි.[26] තවදුරටත් කල්දැමීම සඳහා වන ඉල්ලීම් සඳහා මූලික හේතුව වූයේ වසංගතය ආශ්‍රිත විවිධ බාධාවන් හේතුවෙන් බොහෝ පාසල්වල විභාගවලට අදාළ සම්පූර්ණ විෂය මාලාව ආවරණය කිරීමට අපොහොසත් වීමයි.

කෙසේ වෙතත්, මාසයකට පසුව වුවද, නව දිනයන් ප්‍රකාශයට පත් කර නොතිබූ අතර, අලුතින් නැවත විවෘත කරන ලද පාසල් නැවත සතියකට වසා දැමුවේ කෝවිඩ් රෝගීන්ගේ යළි වැඩිවීමක් සමගම සිසුන් අතර කෝවිඩ් ආසාදිත රෝගීන් තිදෙනෙකු සොයා ගැනීම හමුවේය.[27] කෙසේ වෙතත්, නුදුරේදීම නව දිනයන් ප්‍රකාශයට පත් කරන ලද අතර, 5 වසර ශිෂ්‍යත්වය ඔක්තෝම්බර් 11 ට සහ උසස් පෙළ විභාග ඔක්තෝම්බර් 12 ආරම්භ වීමට නියමිතව තිබුණි.[28] 2021 ජනවාරි මස පැවැත්වීමට නියමිතව තිබූ සාමාන්‍ය පෙළ විභාග 2021 මාර්තු දක්වා තවදුරටත් කල් තබන ලදී.[29]

ඒ අනුව, සිසුන්ගේ ප්‍රවේශ පත්‍ර ඇඳිරි නීති අවසර පත්‍ර ලෙස ප්‍රකාශයට පත් කර, උසස් පෙළ විභාග සහ 5 වසර ශිෂ්‍යත්වය සැලසුම් කළ පරිදි 2020 ඔක්තෝම්බර් මාසයේදී ඇඳිරි නීතිය මධ්‍යයේම පැවැත්විණි. අසාදිත බව තහවුරු වූ කෝවිඩ්-19 සඳහා ප්‍රතිකාර ලබමින් සිටි සිසුන් 16 දෙනෙකු ද ඔවුන් ප්‍රතිකාර ලබමින් සිටි බෝවන රෝග රෝහලේ ස්ථාපිත විශේෂ විභාග මධ්‍යස්ථානයක උසස් පෙළ විභාගයට පෙනී සිටියහ.[30]

ඊළඟ වසරේ, සිසුන් 2021 මාර්තු මාසයේදී සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට සූදානම් වෙමින් සිටියදී, අදාළ සෞන්දර්ය විෂයයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය දෙගිඩියාවෙන් පසු විය. ප්‍රායෝගික පරීක්ෂණ අත්හිටුවන බවත් ඒ වෙනුවට විකල්ප ඇගයීම් ක්‍රමයක් සකසන බවත් අමාත්‍යාංශය මුලින් නිවේදනය කළේය.[31] කෙසේ වෙතත්, දින කිහිපයකට පසු, අමාත්‍යාංශය මෙම තීරණය අවලංගු කළේ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන බව ප්‍රකාශ කරමිනි. මෙලෙස තීරණය වෙනස් කිරීමට හේතු කිසිවක් ඔවුන් දැක්වූයේ නැත. පසුව ප්‍රායෝගික පරීක්ෂණ මැයි මාසයට පැවැත්වීමට නියමිත විය.[32] සාමාන්‍ය පෙළ විභාග සඳහා දින ළං වෙමින් තිබියදී, කෝවිඩ්-19 ට නිරාවරණය වූ සිසුන් සඳහා විශේෂ විභාග මධ්‍යස්ථාන 40ක් ස්ථාපනය වන බව අමාත්‍යාංශය නිවේදනය කළේය.[33] මාර්තු 01 වැනිදා සිට 10 වැනිදා දක්වා මධ්‍යස්ථාන 4,513කදී අයදුම්කරුවන් 622,305ක් සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන්හ.

මාර්තු මාසයේ පැවැත්වුනු සාමාන්‍ය පෙළ විභාගයට පෙර එවකට අධ්‍යාපන අමාත්‍ය ජී.එල්. පීරිස් පැහැදිලි කළේ, "කිසිම අවස්ථාවක සිසුන්ගේ කාලය අපතේ නොයවන" බවත්, "අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛතාවයක්

---

[23] උසස් පෙළ විභාගය කල් දැමීමට තීරණයක් නෑ | ඩේලි නිව්ස් (30.3.2020)

[24] සමාජ මාධ්‍යවල සංසරණය වන '2020 අ.පො.ස උසස් පෙළ' කාලසටහනේ සත්‍යතාවක් නැහැ: විභාග කොමසාරිස් (newsfirst.lk) (25.5.2020)

[25] උසස් පෙළ විභාගය කල් යයි (newsfirst.lk) (9.6.2020)

[26] අධ්‍යාපන අමාත්‍යාංශය 2020 අ.පො.ස උසස් පෙළ විභාග දිනය නැවත සලකා බලයි (newsfirst.lk) (17.6.2020)

[27] පාසල් නිවාඩුව දීර්ඝ කරයි; උසස් පෙළ විභාග නව දිනය තීරණය කිරීමට නියමිතයි (newsfirst.lk) (18.7.2020)

[28] උසස් පෙළ සහ ශිෂ්‍යත්ව විභාග සඳහා නව දින නියම කෙරේ (adaderana.lk) (20.7.2020); 05 වසර සහ උසස් පෙළ විභාග දින ප්‍රකාශයට පත් කෙරේ (newsfirst.lk) (20.7.2020)

[29] අ.පො.ස. සා.පෙළ මාර්තු මාසයේ පැවැත්වීමට නියමිතයි | ඩේලි නිව්ස් (3.12.2020)

[30] IDH හි සිට උසස් පෙළ විභාගයට මුහුණ දෙන කෝවිඩ්-19 ආසාදිත සිසුන් 16ක් | ඩේලි නිව්ස් (24.10.2020)

[31] 2020 අපොස සා/පෙළ ප්‍රායෝගික පරීක්ෂණ අත්හිටුවා ඇත (newsfirst.lk) (6.2.2021)

[32] සා/පෙළ විභාග ඇගයීම් මාර්තු 27 ඇරඹෙයි, ප්‍රායෝගික පරීක්ෂණ මැයි මාසයේදී | මුද්‍රණ සංස්කරණය - ද සන්ඩේ ටයිම්ස්, ශ්‍රී ලංකාව (14.3.2021)

[33] 2020 අපොස සා/පෙළ: විශේෂ විභාග මධ්‍යස්ථාන 40ක් (newsfirst.lk) (24.2.2021)

වූයේ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට හැකි වන ව්‍යුහයක් සකස් කිරීම" බවත් ය.[34]

මේ අතර, පෙර වසරේ පැවති උසස් පෙළ විභාගවල ප්‍රතිඵල 2021 මැයි මාසයේදී නිකුත් කරන ලද අතර, අපේක්ෂකයින්ගෙන් 64% කට ආසන්න ප්‍රමාණයක් විශ්ව විද්‍යාලයට අයදුම් කිරීමට සුදුසුකම් ලබා තිබුණි.[35] කෙසේ වෙතත්, ඇත්ත වශයෙන්ම විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා අපේක්ෂකයින් සංඛ්‍යාව මෙතෙක් නොදනී.

සාමාන්‍ය පෙළ විභාග අවසන් වූ විගස, 2021 උසස් පෙළ විභාග සහ 5 වසර ශිෂ්‍යත්වය අගෝස්තු මාසයේදී (පූර්ව කෝවිඩ් සමයෙහි යෙදුනු ලෙස) නොපවත්වන බව සහ ඉදිරියේදී නව දිනයක් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරන ලදී.[36] ඔක්තෝම්බර් මාසයේදී විභාග පවත්වන බව, ජූලි මාසයේදී නිවේදනය කරන ලදී.[37] කෙසේ වෙතත්, පෙර වසරේදී මෙන්ම, දින කිහිපයකට පසු මෙම තීරණය අවලංගු කරන ලද අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පැවසුවේ විභාග පැවැත්වෙන දිනයන් තවදුරටත් සිතා බලා සමාලෝචනය කර ඉදිරියේදී ප්‍රකාශයට පත් කරන බවයි.[38] ඊළඟ සතියේදී, විභාග නොවැම්බර් මාසයේදී පවත්වන බව නිවේදනය කරන ලදී.[39] කෙසේ වෙතත්, ඔක්තෝම්බර් මාසය වන විට එවකට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත් පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළේ වසංගත තත්ත්වය මෙන්ම පවතින ගුරු-විදුහල්පති වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හමුවේ උසස් පෙළ සහ 5 වසර විභාග පැවැත්වෙන දින සංශෝධනය කළ යුතු බවයි.[40] කෙසේ වෙතත්, දින කිහිපයකට පසුව, ප්‍රේමජයන්ත් ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය නොතකා, අධ්‍යාපන අමාත්‍යාංශය මෙම කල්දැමීම තහවුරු කිරීම ප්‍රතික්ෂේප කළ අතර, අමාත්‍යාංශය මේ පිළිබඳව තවමත් නිල ප්‍රකාශයක් කර නොමැති බව ප්‍රකාශ කළේය.[41] ඒ අතරම, විවිධ බාධාවන් නිසා බොහෝ පාසල්වල සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය කර නොතිබූ බවත්, විභාග පැවැත්වීම අසාධාරණ බවත් විභාග කොමසාරිස් ජනරාල්වරයා පිළිගත්තේය.[42] මේ අතර, සැප්තැම්බර් මාසයේදී අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සියලුම උසස් පෙළ අයදුම්කරුවන්ට ෆයිසර් එන්නත [43] ලබා දෙන බවට පාර්ලිමේන්තුවට දන්වා තිබූ තත්වය තුළ, විභාග ආරම්භ කිරීමට නියමිත දිනට පෙර එන්නත්කරණය සම්පූරණ කිරීමට කල් තියා පළමු මාත්‍රාව ලබාදීම ආරම්භ කර නොමැති බවට රජයට විවේචන ද එල්ල විය.[44] මේ අනුව, ඔක්තෝබර් මස අග වන විට, අධ්‍යාපන පරිපාලකයින් විභාග තවදුරටත් කල් දැමීම නොවැළැක්විය හැකි බවට අදහස් ප්‍රකාශ කරමින් සිටයේ අමාත්‍යාංශය එය නිල වශයෙන් තහවුරු කිරීම ප්‍රතික්ෂේප කරමින් තිබියදීය. කෙසේ වෙතත්, නොවැම්බර් මස මුල වන විට, විභාග කල් දමන බව නිවේදනය කළ ආමාත්‍යාංශය දැනුම් දුන්නේ 5 වසර ශිෂ්‍යත්වය 2022 ජනවාරි මස අග, උසස් පෙළ විභාග පෙබරවාරි මස මුල, සාමාන්‍ය පෙළ විභාග මැයි අග පැවැත්වීමට නියමිත බවය.[45]

මේ අතර පසුගිය සැප්තැම්බර් මාසයේදී විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් උසස් පෙළ විභාගයට සහ 5 වසර ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් භාරගැනීමේ කාලය දීර්ඝ නොකරන බව නිවේදනය කර තිබුණි.[46] උසස් පෙළ විභාග සඳහා අදාළ අයැදුම්පත්‍රවලින් 92%ක් විභාග දෙපාර්තමේන්තුවට ලැබී ඇති බව ඔහු තවදුරත් පවසා සිටින අතරේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණේ කිසියම් සිසුවකුට විභාගයට පෙනී සිටීමට නොහැකි වුවහොත් ඒ ඒ විදුහල්පතිවරුන් විසින් වගකීම දැරිය යුතු

[34] 2020 A/L ප්‍රතිඵල අප්‍රේල් වලට? (adaderana.lk) (28.2.2021)

[35] ශ්‍රී ලංකාව: 2020 අ.පො.ස උසස් පෙළ විභාගයේ අපේක්ෂකයින් 200,000කට ආසන්න සංඛ්‍යාවක් විශ්වවිද්‍යාල සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි (colombopage.com) (4.5.2021)

[36] 2021 ශිෂ්‍යත්ව සහ උසස් පෙළ විභාග අගෝස්තු මාසයේ නොපැවැත්වේ (adaderana.lk) (14.2.2021)

[37] අ.පො.ස උසස් පෙළ විභාගය, 5 වසර ශිෂ්‍යත්වය සඳහා දින ප්‍රකාශයට පත් කෙරේ | Daily News (9.7.2021)

[38] උසස් පෙළ සහ ශිෂ්‍යත්ව විභාග දිනයන් තවදුරටත් සමාලෝචනය කෙරේ (adaderana.lk) (11.7.2021)

[39] 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස උසස් පෙළ විභාග කල් යයි | ඩේලි නිව්ස් (19.7.2021)

[40] 2021 උසස් පෙළ සහ 5 වසර ශිෂ්‍යත්ව විභාග නැවත කල් දමයි? (adaderana.lk) (7.10.2021); ශ්‍රී ලංකාවේ 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස උසස් පෙළ විභාග යලි කල් යයි | එකොනොමි නෙක්ස්ට් (7.10.2021)

[41] උසස් පෙළ කල්දැමීම නොවැළැක්විය හැකි නමුත් මෙතෙක් නිල ප්‍රකාශයක් නොමැත - දි අයිලන්ඩ් (13.10.2021)

[42] *එහිම*

[43] උසස් පෙළ විභාග අපේක්ෂකයින්ට ෆයිසර් කෝවිඩ් එන්නත ලබා දෙනු ඇත | ඩේලි නිව්ස් (21.9.2021)

[44] උසස් පෙළ කල්දැමීම නොවැළැක්විය හැකි නමුත් මෙතෙක් නිල ප්‍රකාශයක් නොමැත - දි අයිලන්ඩ් (13.10.2021)

[45] O/L, A/L සහ 5 වසර විභාග (2021) දින ප්‍රකාශයට පත් කර ඇත (newsfirst.lk) (2.11.2021)

[46] උසස් පෙළ හා 5 වසර ශිෂ්‍යත්වය සඳහා අයදුම් කිරීමේ අවසන් දිනය දීර්ඝ නොකෙරේ: විභාග කොමසාරිස් ජනරාල් (newsfirst.lk) (15.9.2021)

බවය.[47] කෙසේ වෙතත්, අවසාන මොහොතේ විභාග කල්දැමීම හේතුවෙන්, අයදුම් කිරීමේ අවසන් දිනය නැවත වරක් දීර්ඝ කරන ලදී.[48]

2020 සහ 2021 වසර පුරාවටම විභාග අයදුම්කරුවන් දැඩි පීඩනයකට ලක් වූ බව අධ්‍යාපන නිලධාරීන්ගෙන් නිකුත් වන විභාග සම්බන්ධ තීරණවල අවිනිශ්චිත බව සලකා බැලීමේදී පැහැදිලිය.එක් අතකින්, අදාළ විෂය නිර්දේශය ප්‍රමාණවත් ලෙස ආවරණය කිරීමට පෙර විභාග පවත්වනු ඇතැයි යන බිය තිබුණි. අනෙක් අතින්, අවසාන මොහොතේ පවා විභාග කාලසටහන් වෙනස් වීම් ගැන අවිනිශ්චිතතාවයක් තිබුණි. කොවිඩ් ආසාදනය වීමට ඇති ඉඩකඩ ද දිගටම පැවති අතර, සමහර සිසුන්ට කෝවිඩ් අසාදනය වී ප්‍රතිකාර ලබමින් සිටියදීම රෝහල්වල හෝ විශේෂ විභාග මධ්‍යස්ථානවල විභාගවලට මුහුණ දීමට (වෙන හේතු නොමැති වුවද පැවතුනු වාතාවරණය අනුව) බල කෙරුනි. අවම වශයෙන් එක් අධ්‍යාපන අමාත්‍යවරයෙකු හෝ මෙම සිදුවීම් මාලාව සිසුන්ගේ යහපත සහ ඔවුන්ගේ අධ්‍යාපනයේ අඛණ්ඩ පැවැත්ම සඳහා වන බව පැහැදිලි කළද, ආණ්ඩුවේ මෙම තීරණ සිසුන් කොපමණකට අහිතකර ලෙස බලපෑවේ දැයි යමෙකුට කල්පනා කිරීමට සාධාරණ හේතු ඇත. ඇත්ත වශයෙන්ම, විශේෂයෙන් වසංගතයේ විවිධ ගැටළු හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යාපනයට සැලකිය යුතු බාධාවක් නොතිබුනේ නම්, විශාල සිසුන් සංඛ්‍යාවක් ඔවුන්ගේ ජීවිත සහ වෘත්තීය ජීවිතය සමඟ ඉදිරියට යාම සඳහා මෙම සන්ධිස්ථාන ඉක්මනින් පසු කිරීමට නිසැකවම කැමති වන්නට ඇත කෙසේ වෙතත්, රජය විසින් කෙසේ හෝ පැවැත්විය යුතු යැයි අවධාරනය කරන ලද මෙම විභාගවලට මුහුණ දීම සඳහා සිසුන්විශාල පිරිසකට අතිවිශාල දුෂ්කරතා මැද අරගල කිරීමට සිදු වූව බව නොඅනුමානය. ඔවුන්ගේ ප්‍රතිඵල දෙස බලන විට, විශේෂයෙන්ම ඔවුන් සාර්ථක නොවූයේ නම්, රජය මීට වඩා වෙනස් ආකාරයකින් කටයුතු කළේ නම් කුමක් වන්නට තිබුනාද? යන්න ගැන මෙම සිසුන් සදහටම කල්පනා කිරීමට ඉඩ ඇත. දරුණුතම ඛේදවාචකය නම් ඔවුන්ට කිසි දිනක එයට පිළිතුරක් නොලැබීමයි.

*පිරිමි, අවුරුදු 38යි, පෘතුගීසි බර්ගර්, නැගෙනහිර පළාත:*

*"මාර්ගගත අධ්‍යාපනය නාගරික හා පොහොසත් පවුල්වලට සීමා වී තිබෙනවා. ආර්ථික දුෂ්කරතා ඇති ගම්බද පවුල් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නා. අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් පද්ධතියට සහ සිසුන්ට කිසිම දෙයක් කරලා නැහැ...*

*.....විශ්වවිද්‍යාල මට්ටමින් අධ්‍යාපන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විවිධ මුල පිරීම් තිබෙනවා. සිසුන්ට සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට නොමිලේ වේදිකාවක් ලබාදීම සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලය 'Zoom සමඟ ගිවිසුමක් අත්සන් කළා. විශ්වවිද්‍යාලය සඳහා නොමිලේ අන්තර්ජාල පහසුකම් සපයා ඇති නමුත් පාසල් මට්ටමින් ගුරුවරුන්ට සහ සිසුන්ට ඇත්තේ අඩු පහසුකම් සහ තාක්ෂණය පිළිබඳ සීමිත දැනුමක්තව*

*..... ගුරුවරුන්ට සහ සිසුන්ට ඇන්ඩ්‍රොයිඩ් දුරකථන වැනි පහසුකම් සඳහා සහ දත්ත ගාස්තු ගෙවීමට ඔවුන්ගේම මුදල් වියදම් කිරීමට සිදු වුනා. සමහර ගුරුවරුන් අධ්‍යයන කට්ටල සහ පත්‍රිකා පවා නිර්මාණය කර මුද්‍රණය කළ අතර මුද්‍රණ සහ බෙදා හැරීමේ වියදම් ඔවුන් කිසිදු ආධාරයකින් තොරව සිදු කළා. ඡායා පිටපත් සිදු කරන ස්ථාන සොයා ගැනීමට ගුරුවරුන්ට ලොකු වෙහසක් දරන්නට සිදු වුනේ ලොක්ඩවුන් එක හේතුවෙන් ඒවායින් බොහොමයක් වසා දමා තිබූ නිසයි.*

*..... සිසුන්ට සියලුම පාඩම් ලබා දීමට ත්‍රෛභාෂා වෙබ් වේදිකාවක් රජයට ආරම්භ කළ හැකි යැයි මා සිතනවා. පාසල් විෂය මාලාව එකම නිසා පාඩම් පැවැත්වීම පහසුයි. පිරිවැය අඩු වන අතරම සිසුන්ට සහ ගුරුවරුන්ට යම් සහනයක් ඉන් ලැබෙනවා. ඒ වගේම, සිසුන්ට පාඩම් ලබා දීමට රූපවාහිනිය, ගුවන්විදුලිය සහ යූ ටියුබ් වේදිකා භාවිතා කරන්න පුළුවන්. වසංගතය අතරතුර පෘතුගාලයේ අධ්‍යාපන ක්‍රමය මේ ආකාරයෙන් පාඩම් පවත්වන බව මට දැනගන්නට ලැබුනා."*

### අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

මේ අවස්ථාවේදී ස්වාභාවිකම පැන නගින ප්‍රශ්නය නම්, අපි මෙතැනින් යන්නේ කොතැනටද? 2022 ජනවාරි මාසයේදී මෙය ලියන මොහොතේ සමාජය, විශේෂයෙන් අගනුවර, නැවත සාමාන්‍ය තත්වයට පත් වීමට වෙර දරන බව තදින් දැනේ. මෙය සිදු වන්නේ වසංගතය පළමුව පැතිරුණු කාලයේ පටන් "නිව් නෝමල්" (නව සාමාන්‍යය තත්ත්වය) නමැති සංසිද්ධියක් ඇසෙන්නට තිබියදීය. කෙසේ වෙතත්, 2020 ට පෙර තිබූ පැරණි සාමාන්‍ය තත්ත්වය හෝ වසංගතයෙන් පසු ලබාගත් නව සාමාන්‍යය තත්ත්වය හෝ, ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගෙන් බහුතරයකට සාධාරණ ලෙස සැලකුවේ නැත. ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව පැහැදිලිය. එහෙත්, අපට ඉතිරි වන ප්‍රශ්නය නම්, එය සිදු විය යුත්තේ කුමන ආකාරයෙන්ද යන්නයි.

[47] *එහිම*

[48] [අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය දීර්ඝ කෙරේ | ඩේලි නිව්ස්](#) (9.11.2021)

2020 අප්‍රේල් මාසයේදී, වසංගතය පැමිණි විගස, අධ්‍යාපන හා රාජ්‍ය පරිපාලන වෘත්තිකයන්ගෙන් සමන්විත 26 දෙනෙකුගෙන් යුත් අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් ජනාධිපතිවරයා විසින් පත් කරන ලදී. 2020 ජූලි වන විට කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවේ පොදු අධ්‍යාපනය ප්‍රතිසංස්කරණ සඳහා පුළුල් යෝජනා මාලාවක් ප්‍රකාශයට පත් කරන ලදී.[49] අධ්‍යාපනික ශිල්පීය ක්‍රම නවීකරණය කිරීම, ශිෂ්‍ය ඇගයීම් ප්‍රවේශයන් පරිවර්තනය කිරීම, විවිධ වයස්වල විෂයමාලා ව්‍යුහය, උපාධිය සඳහා විකල්ප මාර්ග යනාදී කරුණු ඇතුළුව විවිධ තේමාවන් ආවරණය වන පරිදි මෙම නිර්දේශයන් ඉදිරිපත් කෙරුණි. එහි ඇතුළත් අධ්‍යාපනයේ විෂමතා පිළිබඳ ගැටලුවට අදාළ වන ප්‍රධාන යෝජනා මෙම සාකච්ඡා පත්‍රිකාවේ ඉස්මතු කරන අතර, වඩා තියුණු කියවීමක් සඳහා මූලාශ්‍රය වෙත පාඨකයා අවධානය යොමු කළ යුතු බව සඳහන් කළ යුතුය.

### *පාසල් වර්ගීකරණය*

මෙම පත්‍රිකාවේ වෙනත් තැන්හි විස්තර කර ඇති පාසල් වර්ගීකරණ ක්‍රමයට ආවේණික ගැටලු ගණනාවක් එම වාර්තාවේ සඳහන් වේ. වාර්තාව මගින් ඉස්මතු කරන ලද ප්‍රධාන කරුණක් වන්නේ යම් පාසලක වර්ගීකරණය සහ එහි විදුහල්පතිවරයාගේ වේතනය අතර ඇති සම්බන්ධයයි. තවද, එහි හුවා දක්වන්නේ මේ කරුණ හේතුවෙන්, හුදෙක් වඩා වැඩි වේතනයක් ලබා ගැනීම උදෙසාම, දෙවන සහ තුන්වන වර්ගයේ පාසල්, අවශ්‍යතා සපුරාලීමකින් තොරව(සම්පත් මත පදනම් වූ)  ඉහළ කාණ්ඩයකට නැවත වර්ගීකරණය කිරීමට අනවශ්‍ය ලෙස විදුහල්පතිවරුන් පෙළඹීමයි. අනෙක් අතට, අඩු වැටුප් සහ ප්‍රාථමික පාසල් අතර සම්බන්ධය හේතුවෙන් ප්‍රාථමික පාසල් සඳහා උසස් තත්ත්වයේ විදුහල්පතිවරුන් ලබා ගැනීමේ දුෂ්කරතාවයන් මෙම ගැටලුව නිසා අධ්‍යාපන පරිපාලකයන්ට ඇති වේ. ප්‍රාථමික මට්ටම්වල උගන්වන අඩු වේතනයක් ලැබෙන දෙවන සහ තුන්වන වර්ගයේ පාසල්වල ගුරුවරුන්ට ද එවැනිම ප්‍රශ්නයක් අදාළ වේ. මේ හේතුවෙන් වඩා හොඳ සුදුසුකම් ලත් ගුරුවරුන් ඉහළ කාණ්ඩයේ පාසල්වල රැකියා සොයන්නට පෙළඹීමත්, කුඩා පාසල්වලින් දක්ෂ ගුරුවරුන් ඉවත් වීමත් සිදු වන්නේ, ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් බහුතරය එම කුඩා පාසල්වලින් සමන්විතව තිබියදීය. 1ඊ වර්ගයේ පාසල් (එනම් උසස් පෙළ විද්‍යා විෂය ධාරාවන් ඇතුළු පාසල්) "වඩා හොඳ පාසල්" ලෙස වටහා ගැනීම නිසා පාසලක කාර්ය සාධනය තක්සේරු කිරීමේ ප්‍රධාන නිර්ණායකය වන්නේ ශිෂ්‍ය කේන්ද්‍රීය ගුණාත්මක අධ්‍යාපනයක්ය යන්නෙන් අවධානය වෙනතකට යොමු කෙරේ.අනෙක් අතට, එම වාර්තාවට අනුව, බොහෝ පාසල් සංවර්ධන වැඩසටහන්, ජාතික සහ පළාත් මට්ටම් යන දෙකෙන්ම, අවධානය යොමු කිරීමට නැඹුරු වන්නේ 1AB වර්ගයේ පාසල් කෙරෙහි වන අතර එමඟින් ඒවා "ජනප්‍රිය" පාසල් ලෙස හඳුනා ගැනීම තවදුරටත් තහවුරු වේ. පවතින ක්‍රමයේ සමූහික ප්‍රතිඵලය වන්නේ කුඩා පාසල්වල සම්පත් සිඳලමින් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ඒවා අත්හැර යාමට පෙළඹවීම සහ නිරන්තරයෙන්  එම පාසල් වැසී යාමේ තර්ජනයකට ලක්වන තරමටම සිසුන් ඇතුළත් වීම අධෛර්යමත් කිරීමයි. ස්වභාවයෙන්ම, දුප්පත්ම, අඩුම හැකියාවක් ඇති පවුල්වල දරුවන් එවැනි පාසල් වල ඉතුරු වේ.

මේ සම්බන්ධයෙන් වන ප්‍රධාන යෝජනාව වන්නේ දැනට පවතින වර්ගීකරණ ක්‍රමය අහෝසි කර, ප්‍රාථමික හෝ ද්විතීයික ලෙස සරලව පාසල් වර්ග කරන ක්‍රමයකට මාරුවීම සහ දැනට ප්‍රාථමික හා ද්විතීයික අංශ ඇතුළු සියලුම පාසල් "පියවර වශයෙන් අවසන් කිරීමේ ක්‍රමයක්" හරහා වෙන් කොට ඒවායේ ප්‍රාථමික අංශ ස්වාධීන පාසල් ලෙස පවත්වාගෙන යාමට ඉඩ සැලසීමයි. මෙම යෝජනාවේ අපේක්ෂාව වන්නේ එලෙස ප්‍රාදේශීයව ප්‍රාථමික පාසල් ජාලයක් නිර්මාණය කර ඒවායේ සිසුන් එම එක් එක් ජාලය සඳහා නම් කරන ද්විතීයික පාසල් වලට ඇතුළත් කරවීමට සැලැස්වීමයි. ජාතික පාසල් 1000ක් එවැනි ද්විතීයික පාසල් බවට පත් කිරීමට වාර්තාව යෝජනා කරයි. මෙලෙස ජාලගත වී ඇති ද්විතීයික පාසල් අතරේ උසස් පෙළ විෂය ධාරාවන් කාර්යක්ෂමව බෙදා හරින්නට නැවත විමසීමක් සිදු කරනු ලබන අතර  එමඟින්, වාර්තාව පෙන්වන පරිදි පාසල්වල බහුවිධ විෂය ධාරාවන් ඉගැන්වීමේදී සිදුවන නාස්තිය වළක්වාලමින්, එම පාසල් වල සංකේන්ද්‍රණය වී ඇති සම්පත් නැවත බෙදා හැරීමට හැකි වනු ඇත. තවද, විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල පත්වීම් අවශ්‍යතා මත පදනම් වූ ප්‍රවේශයක් මත පමණක් සිදු කෙරෙන අතර, උසස් සේවා ශ්‍රේණිවල විදුහල්පතිවරුන් විශේෂ දිරිගැන්වීම් පැකේජ සමග ප්‍රාථමික පාසල් වෙත විශේෂයෙන් යොමු කරනු ඇත. මෙම යෝජිත නව ප්‍රවේශය හරහා පාසල් පරිපාලනය කාර්යක්ෂම කිරීමට, උසස් තත්ත්වයේ ද්විතීයික පාසල් සංවර්ධනයට ඉඩ සැලසීමට, ජනප්‍රිය පාසල් සඳහා තරඟකාරිත්වය අඩු කිරීමට

[49] ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය, *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නැවත පරිකල්පනය කිරීම*, දෙවන වෙළුම, මූලික කණ්ඩායම් වාර්තා (දිනය නැත), http://nec.gov.lk/wp-content/uploads/2020/10/5.Re-imagining-Education-in-Sri-Lanka-Vol-II-Core-Group-Reports-by-Presidential-Task-Force.pdf හරහා ලබා ගත හැක (ප්‍රවේශය 24.1.2022)

මෙන්ම සම්පත් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ප්‍රාථමික පාසල් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

මේ සම්බන්ධ තවත් ප්‍රධාන යෝජනාවක් වන්නේ සම්පත් බෙදාගැනීම පිළිබඳවයි. වාර්තාව තුළ පාසල් හරහා භෞතික සම්පත් බෙදා හැරීම පිළිබඳ සංඛ්‍යාලේඛන ඉස්මතු කරන අතර (සියලුම පාසල්වලින් 3,800කට පමණක් ICT විද්‍යාගාර ඇති බව සහ O/L පන්ති ඇති පාසල්වලින් 52%කට පමණක් O/L විද්‍යාගාර ඇති බව වැනි කරුණු) එක් පාසලක් තුළ සංකේන්ද්‍රණය වී ඇති සම්පත් වෙත ප්‍රවේශ වීමට පාසල් කිහිපයක සිසුන්ට ඉඩ සලස්වන සම්පත් බෙදාගැනීමේ ආකෘති සංවර්ධනය කිරීමට යෝජනා කරයි. එසේම, වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ මුළු ගුරු හිඟය 66,512 ක් වන අතර, ශ්‍රී ලංකාවේ මුළු ගුරු අතිරික්තය 41,512 කි. එනිසා හඳුනාගත් නිර්ණායක මත පදනම්ව පාසල් පද්ධතිය විධිමත් කිරීමේ වැඩපිළිවෙලක අවශ්‍යතාවය සහ "මධ්‍ය පාසලක්" සමඟ සම්පත් බෙදාගැනීමට පාසල් ජාල සඳහා වැඩසටහනක අවශ්‍යතාවය ද වාර්තාවෙන් අවධාරණය කෙරේ.

ප්‍රාථමික ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් ද්විතීයික පාසල් හා සමානව දිරිගැන්වීමට,, අභිප්‍රේරණයට සහ පිළිගැනීමට ලක් කෙරෙනු ඇත. ප්‍රාථමික පාසල්වල විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වැටුප් ව්‍යුහයන් සහ අනෙකුත් ප්‍රතිලාභ, හැකි පමනින් ද්විතියික පාසල්වල කාර්ය මණ්ඩලයට සමානවම උසස් කිරීමට යෝජිතය. ප්‍රාථමික ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට, විශේෂයෙන්ම ග්‍රාමීය අභියෝග සහිත ප්‍රදේශවල සේවය කරන අයට අමතර මූල්‍ය දිරිගැන්වීම්, කාර්ය සාධන ඇගයීම්වලදී විශේෂ පිළිගැනීම් , ස්ථාන මාරුවීම් සහ උසස්වීම් ද ලබා දෙනු ඇත. ප්‍රාථමික පාසල් ගුරුවරුන්ව ප්‍රාථමික අධ්‍යාපනය සඳහා විශේෂයෙන් පුහුණු කරනු ලබන අතර, විද්‍යා, වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්හි අධ්‍යාපනය ලැබූ ගුරුවරුන් ද ප්‍රාථමික පාසල් ගුරුවරුන් වීමට දිරිමත් කළ යුතුය.

*ශිෂ්‍ය ඇගයීම*

5 වසර ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ යන විභාග තුන කෙරෙහි අවධානය යොමු කර ඇති වත්මන් ශිෂ්‍ය ඇගයීම් ක්‍රමයට අදාළ ගැටලු ද කාර්ය සාධක බලකායේ වාර්තාවෙන් පෙන්වා දී ඇත. මෙම වාර්තාව යෝජනා කරන්නේ "සම්පූර්ණ ඇගයීම්" (summative assessment) ප්‍රවේශයක් මත පදනම් වූ මෙම ක්‍රමයෙන් ඉවත් වී "වර්ධන ඇගයීම්" (formative assessment) මත පදනම් වූ ක්‍රමයකට මාරු විය යුතු බවයි. එමගින් සිසුන්ගේ ඉගෙනීම, විෂය කරුණු පැය කිහිපයක ලිඛිත පරීක්ෂණයකට කටපාඩමින් ලිවීමට දරුවන්ට ඇති හැකියාවෙන් අවධානය ඉවත් කරන අඛණ්ඩ පදනමක් මත ඇගයීමට ලක් කරන ඇගයීම් වලින් සිසුන්ගේ ඉගෙනීම් මනිනු ලැබේ. ඒ වෙනුවට දරුවන්ගේ නිර්මාණශීලිත්වය, සෞන්දර්යය, ක්‍රීඩා සහ ප්‍රජා වැඩ ආදිය කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත. අපක්ෂපාතිත්වය සහ සාධාරණත්වය පවත්වා ගැනීම සඳහා පුද්ගලයන් කන්ඩායමක් (පැනල) විසින් සිදු කරන ඇගයීම් ද වාර්තාව නිර්දේශ කරයි.

කෙසේ වෙතත්, වත්මන් සන්දර්භය තුළ 5 වසර ශිෂ්‍යත්වය ඉටු කරන කාර්යභාරය නොසලකා නොහරිමින්, වාර්තාව මඟින් 5 වසරේ දී පවත්වනු ලබන සරල පරීක්ෂණ මත පදනම්ව දක්ෂ හා අවශ්‍යතා ඇති සිසුන් සඳහා ශිෂ්‍යත්ව යෝජනා කරයි. මීට අමතරව, 1 වසරේ පටන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ඉගෙනුම් ආධාරක ප්‍රදානයක්, හැකි නම් පවුල් මත පදනම් වූ සහනාධාර ප්‍රදානයක් හා ඒකාබද්ධව, ලබා දීමට යෝජනා කරයි. චිත්තවේගීය බුද්ධිය, සාමාන්‍ය යෝග්‍යතා සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ අවධානය යොමු කරන සරල පරීක්ෂණයක් අඩු ආදායම්ලාභී සමූහවල කැපී පෙනෙන සිසුන් හඳුනා ගැනීම සඳහා පැවැත්වීමට යෝජිතය (පරීක්ෂණය සඳහා අයදුම් කළ හැක්කේ නම් කරන ලද ආදායම් මට්ටමට අඩු පවුල්වල දරුවන්ට පමණි). 5 වසර ශිෂ්‍යත්වය, ද්විතීයික පාසල්වලට ඇතුළත් කර ගැනීම සඳහා ළමුන් තෝරා ගැනීමට සුදුසු සරල පරීක්ෂණයකින් ප්‍රතිස්ථාපනය කෙරේ. ප්‍රාදේශීය ප්‍රාථමික පාසල් ජාල මගින් පෝෂණය වන ද්විතීයික පාසල් දහසක් (1000) පිහිටුවීමෙන් තම දරුවන් ජනප්‍රිය පාසල්වලට ඇතුළත් කර ගැනීමට දෙමාපියන්ගේ තරගය අවම කිරීමට අපේක්ෂා කෙරේ.

තවද, පාසල් වියේදීම සිසුන් සඳහා වෘත්තීය, පොලිටෙක්නික්, තාක්ෂණික සහ වෙනත් විකල්ප ඇතුළුව බහුවිධ අධ්‍යන මාර්ග යෝජනා කිරීම තුළින් සිසුන්ගේ අනාගතය තීරණය කිරීමේදී O/L සහ A/L විභාග ඉටු කරන කාර්යභාරයට ඇති අවධාරණය අඩු කිරීම වාර්තාව නිර්දේශ කරයි. එමෙන්ම, ගණිත අධ්‍යාපනයේ ස්ථර දෙකක් පිළිබඳ අදහසක් වාර්තාව ප්‍රවර්ධනය කරන අතර එහිදී උසස් ගණිත අධ්‍යයනයක් කිරීමට අපේක්ෂා නොකරන සිසුන්ට ප්‍රායෝගික මට්ටමින් ගණිතය ඉගෙන ගැනීම පමණක් අපේක්ෂා කෙරේ. O/L හෝ A/Lවලින් පසු සිසුන්ට වෘත්තීය පුහුණුව සඳහා ප්‍රවේශ විය හැකි විවධ මට්ටම් පිළිබඳව මේ යෝජනාවේ විස්තර කෙරේ.

*ගුරු සංවර්ධනය*

ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය තුළ ගුරුවරුන් ලබා ගැනීම සම්බන්ධ විවිධ ගැටලු සැලකිල්ලට ගනිමින්, මෙම වාර්තාව ගුරු සංවර්ධන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ද නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරයි.

මේ අතර ප්‍රධාන වන්නේ ගුරුවරුන්ගේ ප්‍රතීතනය (accreditation) සඳහා පහසුකම් සැලසෙන ඉගැන්වීම් බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමයි. විචාරාත්මක චින්තනය, ඉගෙනීමේ උද්යෝගය මෙන්ම පරාර්ථකාමිත්වය සහ සහකම්පනය වැනි වෙනත් සමාජ කුසලතා ආවරණය කිරීම තුළින් සිසුන්ගේ අනාගතයට මඟ පෙන්වීම සඳහා ගුරුවරුන්ට උපකාර කිරීම උදෙසා ගුරු පුහුණුව වැඩිදියුණු කරනු ලැබේ. අනර්ඝ උසස් අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කිරීමේදී, විශේෂයෙන්ම ප්‍රමාණවත් වේතන සහ ප්‍රතිලාභ හරහා ගුරුවරුන්ගේ සමාජ මට්ටම ඉහළ නැංවීමේ වැදගත්කම වාර්තාව තුළ අවධාරණය වේ. තවද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය ආදියේ සියලු පත්වීම් සඳහා පන්තිකාමර වල වැඩ කොට ලැබූ අත්දැකීම පූර්ව අවශ්‍යතාවයක් කළ යුතු බව ද වාර්තාව යෝජනා කරන්නේ අධ්‍යාපන සේවා ක්ෂේත්‍රය තුළ ගුරු සේවයේ ප්‍රමුඛත්වය ඉස්මතු කරමිනි. එමගින් සියලුම අධ්‍යාපන සේවා සඳහා ප්‍රවේශය ගුරු සේවය වනු ඇත. ජාතික අධ්‍යාපන ආයතනය සහ පන්තිකාමරය අතර සම්බන්ධක පුරුක ලෙස සේවය කරන, ගුරුවරුන් සමඟ නව දැනුම බෙදාගන්නා, ගුරුවරුන් සඳහා ආදර්ශ පන්ති පවත්වන සහ ඉගැන්වීමේ ක්‍රම හා ක්‍රියාවලි ගැන දිරිගන්වන සංවාදයන් ඔවුන් සමග ගෙන යන 'ඉගෙනුම් ක්‍රියාවලි සම්බන්ධීකාරකවරුන්' නම් නව සේවාවක් බවට ගුරු උපදේශකවරුන් පරිවර්තනය කිරීමට ද වාර්තාව යෝජනා කරයි.

***නිගමනය***

වසංගතය සුවිශේෂී අපහසුතාවයන් ඇති කළ නමුත් අධ්‍යාපන ක්ෂේත්‍රයට අවශ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ අළුත් ලෙස සිතීම ඉහළම ආයතනික මට්ටමින් සිදුවෙමින් පවතී. මෙම නව ප්‍රතිපත්ති දිශානතිය ගවේෂණය කිරීමේදී ඇති පැහැදිලි බාධාව නම් දේශපාලන අධිෂ්ඨානය නොමැතිකමයි (සහ ධෛර්යය නොමැතිකම?). පවතින රජය විසින් ස්ථාපිත කරන ලද යාන්ත්‍රණය විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිසංස්කරණ යෝජනා මාලාව පැහැදිලි ලෙස පුළුල් වුවද, එම රජයේම අනුප්‍රාප්තික ජාතික අයවැය එම යෝජනා සඳහා කුඩම්මාගේ සැලකිලි දක්වා ඇත. ආණ්ඩුව විසින් පිළිගෙනඇති බව පෙනෙන එකම නිර්දේශය වන්නේ ජාතික පාසල් 1,000ක් පිහිටුවීමයි. එනමුදු එය නව්‍ය යෝජනාවක් නොවීය. ඇත්ත වශයෙන්ම, 2020 මාර්තු මාසයේදී, වසංගත ක්‍රියාමාර්ග දිග හැරීමට දින කිහිපයකට පෙර සහ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවීමට සති කිහිපයකට පෙර, රජයේ ඊනියා ජාතික පාසල් දහසේ වැඩසටහනට අනුකූලව ජාතික පාසල් සංඛ්‍යාව 500 දක්වා වැඩි කිරීමට සූදානම්ව සිටියේය.[50] එම සැලසුම්වලට වසංගතයෙන් බාධා වූ බවක් බවක් පෙනෙන්නට තිබුණද (2020 පාසල් සංගණනය වාර්තා කරන්නේ ජාතික පාසල් 373ක් පමණක් බැවින්) ජාතික පාසල් 1000ට මුලපිරීම එතැන් සිට නැවත පණ ගන්වා ඇත.[51] කෙසේ වෙතත්, ඉහත සාකච්ඡා කළ පරිදි සියලුම පාසල් ප්‍රාථමික හෝ ද්විතීයික පාසල් ලෙස දෙකට බෙදීමේ පුළුල් යෝජනාවේ සන්දර්භය තුළ ජාතික පාසල් 1000ක් පිහිටුවීමට ජනාධිපති කාර්ය සාධක බලකාය නිර්දේශ කරන බව සඳහන් කළ යුතුය. එසේ නොමැතිව ජාතික පාසල් 1000ක් පමණක් පිහිටුවීමෙන් මෙම සාකච්ඡා පත්‍රිකාවේ ඉස්මතු කර ඇති අධ්‍යාපනයේ විෂමතා තුරන් කිරීමට එතරම් දෙයක් සිදු නොවනු ඇති අතර, ඇත්ත වශයෙන්ම, ඒවා තවදුරටත් උග්‍ර කරනු ඇත.

වසංගතයේ දරුණුතම බලපෑම ඇති වූයේ දුප්පතුන්ගෙන්ද දුප්පත්ම ප්‍රජාවට බව නිසැක වුවද, අධ්‍යාපනය ඇතුළුව සෑම අංශයකින්ම, මෙම කරුණ විදහා දක්වන දෘඪ දත්ත ඉතාමත් මද වන අතර එය බොහෝ මට්ටම්වල බහිර්නිවේශනය (extrapolation) මත රඳා පවතී. මින් පෙර ලොව පුරා ඇති වූ විපත්තිවලින් දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම නිසා ඇති වූ තද බලපෑම් පෙන්නුම් කර ඇත. පසුගිය වසර දෙක තුළ අධ්‍යාපනයෙන් ඉවත් වූ සිසුන් හඳුනාගෙන නැවත අධ්‍යාපනයට යොමු කිරීම සහතික කිරීමට රජය වහා කඩිනම් පියවර ගත යුතු අතර විශේෂයෙන්ම ඔවුන්ගේ හදිසි සමාජ ආර්ථික අවශ්‍යතා සපුරාලිය යුතුය. තවද, දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපනයේ සැලකිය යුතු විෂමතාවයන් තුරන් නොකර කිසිදු ආර්ථික අර්බුදයක් සාර්ථක ලෙස දිගු කාලීනව සමනය නොවන තත්වයක් තුල, අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් යෝජනා කරන ලද උපාය මාර්ගයන්ට ප්‍රමුඛතාවය දීක්‍රියාත්මක කිරීමට රජය ඉක්මන් පියවර ගත යුතුය.

[50] නව පාසල් 125ක් ජාතික පාසල් ලෙස නම් කෙරේ - අධ්‍යාපන අමාත්‍යාංශය (newsfirst.lk) (8.3.2020)

[51] ශ්‍රී ලංකාව: ජාතික පාසල් 1000 පිහිටුවීමේ වැඩසටහන හෙට ඇරඹේ (colombopage.com) (6.1.2022)